**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - 2021**

---------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැංකු ගිණුම් 02 කට අදාළව, 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය තුල ඇතුළත් 2022 ජනවාරි සහ පෙබරවාරි මාසවලදී හඳුනාගෙන තිබූ රු.52,680 ක් වූ හඳුනා නොගත් ඍජු බැංකු බැර කිරීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි ඡේද අංක 03 හා 08 ප්‍රකාරව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ගැළපීමකින් තොරව අවිනිශ්චිත ගිණුමක ඇතුළත් කර තිබුණි. | 2022 අවසන් ගිණුම් විගණනය සඳහා ලබාදෙනවිට සියලුම නිවැරදිකිරීම් සිදුකර ඇත. | ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 34 වන ඡේදය ප්‍රකාරව සංස්ථාවේ දේපළ පිරියත හා උපකරණ වල සාධාරණ අගය කාලීනව වෙනස්වීම මත එම වත්කම් වසර 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත්, සංස්ථාව විසින් ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමක් සිදුකර නොතිබුණි. | ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු වාර්තා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී. | ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් එකතුව රු.171,764,741 ක් වටිනා ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති අතර ප්‍රමිතයේ අංක 79(ආ) ඡේදය ප්‍රකාරව එම වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. ඒ අනුව එම වත්කම්වල ඵලදායී ජීව කාලය පිළිබඳ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ | නිරීක්ෂණ නිවැරදිය. මෙම වටිනාකම් වලින් යුතු ස්ථාවර වත්කම් දැනට භාවිතයට නොගන්නා අතර එම වත්කම් වලින් කෞතුක භාණ්ඩ ලෙස ප්‍රදර්ශනය කල හැකි වත්කම් දැනට චිත්‍රාගාරය තුල | ප්‍රමිතියේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රදර්ශනය සඳහා රඳවාගෙන ඇත. | |
| (ඇ) 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සෙමින් චලනය වන සහ චලනය නොවන තොගයෙහි මුළු වටිනාකම රු.8,597,176 ක් විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 79 (අ) ඡේදය ප්‍රකාරව නිශ්කාර්ය වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොත් අගයට හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථා පරිශ්‍රය තුළ හා ඉන් පිටත සංස්ථාවට අයත් ගොඩනැගිලි තුළ පවතින නිශ්කාර්ය වත්කම් හා යල් පැනගිය පැරණි වත්කම් පිළිබඳ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. | ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවේ පරිගණක ගිණුම්කරණ මෘදුකාංගය (Quick Book) තුළින් ලබා ගන්නා ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව මුළු වත්කම්වල වටිනාකම රු.902,469,609 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු.1,041,333,428 ක් ලෙස දක්වා තිබූ අතර පරිගණක ගිණුම්කරණ මෘදුකාංගය මඟින් ලබාගත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය අනුව රු.6,715,038 ක ඌණතාවයක් පැවතියද විගණනයට ඉදිරිපත් කරන ලද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.9,417,553 ක අතිරික්තයක් ලෙස දක්වා තිබීමෙන් එම ශේෂ අතර රු.154,996,410 ක වෙනසක් පැවතුණි. | නිරීක්ෂණය නිවැරදිය. QB ගිණුම්කරණ මෘදුකාංගය තුලින් ලබාගත් මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අතර වෙනසට හේතු සොයාගත් අතර ඒවා නිවැරදි කිරීමට කටයතු කරමි. | පරිගණක ගිණුම්කරණ මෘදුකාංගය (Quick Book) තුලින් ලබා ගන්නා ලද දත්තයන්ගේ නිවැරදිතාවය තහවුරු කර ගැනිමට ක්‍රියා කළයුතු අතර වෙනස නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| (i) චිත්‍රපට කුලී ණය ගැතියෝ | 395,060,050 | 375,003,940 | 20,056,110 | නිරීක්ෂණය නිවැරදියි | වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතුය |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii)ණයහිමි ශේෂය | 294,809,272 | 263,037,778 | 31,771,494 | නිරීක්ෂණය නිවැරදියි | වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතුය |

**1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව සතුව පැවති චිත්‍රපට බෙදාහැරීමේ ඒකාධිකාරය 1999 වර්ෂයේදී අහෝසි කිරීමත් සමඟ සංස්ථාවේ ප්‍රධාන ආදායම වූ බෙදාහැරීමේ කොමිස් මුදල් අහිමිවී තිබූ අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා සිනමාහල් වසා දමා තිබීම මත සංස්ථාවේ ආදායම් මාර්ග අහිමි වී තිබුණි. හිඟ ණය ශේෂ අයකර ගැනීමටද සංස්ථාව අපොහොසත්වීම හේතුවෙන් මුදල් ප්‍රවාහයේ දුර්වලවීමක් නිරීක්ෂණය විය. සංස්ථාවේ වියදම පියවා ගැනීමට ආදායම ප්‍රමාණවත් නොවීම මත 2001 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයෙන් සේවක වැටුප් හා ප්‍රාග්ධන වැය සඳහා ප්‍රතිපාදන සලසාදී තිබුණි. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක කාලය තුළ සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලබන තත්ත්වයක පැවතීම හේතුවෙන් වර්තමානය වනවිට රජයේ මූල්‍ය සහය හා කෙටිකාලීන තැන්පතු පොළී ආදායම් නොමැතිව සංස්ථාව අඛණ්ඩ පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | නිරීක්ෂණ නිවැරදිය | සංස්ථාවේ ආදායම් වැඩිදියුණු කර ගැනීමටත්, හිඟ ණය ශේෂ අයකර ගැනීමටත්, සංස්ථාවේ පැවැත්ම පිළිබඳ ස්ථාවරත්වයක් ගොඩනඟා ගැනීමටත්, පනත ප්‍රකාරව වූ කාර්යයන් ඉටු කිරීමටත් ක්‍රියා කළයුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 1645(අ) සහ පොදු 267 අකෘති පත්‍රය | මෙම මුදල් රෙගුලාසිය සහ පොදු 267 ආකෘතිය අනුව වාහන සඳහා ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබූ අතර, ලොග් සටහන් පොත්වල ගමන් පිළිබඳ මාසික සාරාංශ විස්තර සටහන් කර නොතිබුණි. | ලොග් පොත්වල අඩුපාඩු නිවැරදි කිරීමට උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 1645(ආ), 1646 සහ පොදු 268 අකෘති පත්‍රය | මෙම මුදල් රෙගුලාසි ප්‍රකාරව ධාවන සටහන් පොත් නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබූ අතර, පොදු 268 ආකෘති පත්‍රය ප්‍රකාරව වාර්තා සටහන් කර නිතිපතා පරීක්ෂා කර නොතිබුණි. | ධාවන සටහන් පොත් හා අදාළ වාර්තා පරීක්ෂා කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(අ) සහ (ආ) ඡේද | 2021 වර්ෂය වන විට සංස්ථාව සතුව මෝටර් රථ වාහන 14 ක් පැවති අතර, 2020 වර්ෂයේ සිටම වාහන 06 ක් ධාවනයෙන් ඉවත් කර තිබුණි. 2022 වර්ෂය වන විට එක් මෝටර් රථයක් පමණක් ධාවනයේ යොදවා තිබූ අතර, මෙම චක්‍රලේඛය ප්‍රකාරව අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ ධාවනය නොකරන වාහන අපහරණය කිරීමට ක්‍රියාකර නොතිබුණි. | සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය සියළු වාහන අළුත්වැඩියා කර ධාවනයේ යෙදවීමට උපදෙස් ලබාදී ඇත. සංස්ථාවේ මුදල් තත්ත්වය අනුව අළුත්වැඩියා කිරීමට පියවර ගෙන ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

## 1.7 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------------------------ | -------------------- | ---------------- |
| (අ) | සංස්ථාව පරිගණක මගින් ගිණුම් තැබීම සඳහා "ක්වික් බුක්" (Quick Book) මෘදුකාංග පද්ධතිය 2020 වර්ෂයේ සිට භාවිතා කර තිබුණි. තොරතුරු තාක්ෂණ අංශයක් රහිතව සහ මෘදුකාංග පද්ධතියේ අධීක්ෂණය හා පාලනය සඳහා වගකිව යුතු අධීක්ෂණ නිලධාරියෙකු රහිතව භාවිතා කළ මෙම පද්ධතිය සඳහා විධිමත් අභ්‍යන්තර පාලන සහ පද්ධති පාලන උපක්‍රම හඳුන්වා දී නොතිබුණි. මෙම පරිගණකගත ගිණුම්කරණ පද්ධතියට සමගාමීව ලිඛිතව පොත්පත් පවත්වාගෙන යාම 2020 | ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය සම්බන්ධයෙන් විගණනයේදී පෙන්වා දී ඇති දුර්වලතා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ආයතනය තුළ ගිණුම් තැබීමට භාවිතා කරන "Quick Book" මෘදුකාංගය භාවිතයේදී පුහුණුව සහ අභ්‍යන්තර පාලන උපක්‍රම හඳුන්වාදී විගණන විමසුම මගින් පෙන්වාදුන් ගැටලු |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේදීම නතර කර තිබූ අතර, අතීතානුයෝගීව පද්ධතියට දත්ත හා තොරතුරු ඇතුළත් කිරීමට සහ පද්ධතියෙන් දත්ත ඉවත් කිරීමට පද්ධතිය තුළ පැවති විශේෂ හැකියාව නිසා විගණනයට ඉදිරිපත් කරනු ලබන මූල්‍යමය සංඛ්‍යා දත්ත වල විශ්වාසනීයභාවය පිළිබඳ ගැටළු ඇති වී තිබුණි. පරිගණක දත්ත වල අමතර පිටපත් (Backup) ආරක්ෂිතව තබා නොගැනීම සහ ඒවා යළි පද්ධතියට ඇතුළත් කළ නොහැකිවීමත්, පද්ධතිය සඳහා කාර්යක්ෂම දෘඩාංග නොමැති වීමත්, බාහිර විගණකට පද්ධතියට ප්‍රවේශ වීමට අවස්ථාව සීමා වීමත් මත පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දුන් මෙම පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය තුළ වූ අවදානම අවම කිරීමට පියවරගෙන නොතිබුණි. | | නිවැරදි කර පරිගණක මෘදුකාංගය භාවිතා කළ යුතුය. |
| (ආ) | සංස්ථාව විසින් ගිණුම් තැබීම, චිත්‍රපට කුලී ආදායම් පිළිබඳ වාර්තා තබා ගැනීම සහ වැටුප් ඇතුළු සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් ගෙවීම් පිළිබඳ වාර්තා තබා ගැනීම සඳහා පිළිවෙලින් ක්වික් බුක්, සීෆා සහ විෂුල් බේසික් නම් වූ එකිනෙකට සබඳතාවන් රහිත පරිගණක මෘදුකාංග 03 ක් භාවිතා කර තිබුණි. මෙම මෘදුකාංග අතර දත්ත හා තොරතුරු ස්වයංක්‍රීයව හුවමාරු නොවීම නිසා වැරදි සහ වංචාවන් සිදුවීමේ වැඩි ඉඩකඩක් පැවති අතර, ආයතනයේ අභ්‍යන්තර විගණනය 2022 වර්ෂය තුළ සම්පූර්ණයෙන් අක්‍රියවීමත්, පරිගණකගත අභ්‍යන්තර පාලන සහ පද්ධති පාලන උපක්‍රම අවමවීමත් නිසා පරිගණකගත ගිණුම්කරණ සංඛ්‍යා දත්ත සහ වාර්තා විශ්වාසනීයත්වයෙන් තොර වූ අතර, ඒවා සංසන්දනාත්මකව පරීක්ෂා කළ නොහැකි විය. | මෙම වැඩසටහන් එකිනෙකට ස්වාධීන පද්ධතීන් ලෙස ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන් අතර ස්වයංක්‍රීයව තොරතුරු හුවමාරුව සඳහා වෙනම පරිගණක වැඩසටහනක් සකස් කළ යුතුව ඇත. ඉදිරියේදී පෙන්වාදී ඇති පරිදි වැඩිදියුණු කිරීම් සිදු කරනු ඇත. | අභ්‍යන්තර පාලන උපක්‍රම සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේද සකස් කර හඳුන්වාදිය යුතු අතර, අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමටත් පද්ධති පාලන උපක්‍රම භාවිතා කරමින් සංසන්දනය කළ හැකි අයුරින් මෙම වාර්තා සකස් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,417,553 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,139,436 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,278,117 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ පුනරාවර්ථන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.100,000,000 ක ප්‍රදාන හේතුවී තිබූ අතර, මේ හේතුවෙන් සංස්ථාවේ සමස්ත මෙහෙයුම් අලාභය වූ රු.90,582,447 ක් ආවරණය වී රු.9,417,553 ක අතිරික්තයක් ඇති වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.68,456,027 ක් වූ සිනමාශාලා 69 ක් මඟින් ණයගැති ශේෂ සනාථන ලිපි කැඳවීම් සිදු කළ අතර, සිනමාශාලා වසා දැමීම, කඩා ඉවත් කිරීම සහ සිනමාශාලා එම ලිපිනයන් වල නොමැති වීම නිසා ශේෂ සනාථන ලිපි 27 ක් ආපසු සංස්ථාව වෙතම ලැබී තිබුණි. ඒ අනුව එම සිනමාශාලා 27 මත සංස්ථාවට අයකරගත නොහැකි හිඟ මුදල රු.23,380,463 ක් විය. | නිරීක්ෂණය නිවැරදිය. | ණය වාරික හා පොළී අයකර ගැනීම පිළිබඳ වූ ක්‍රියාවලිය ඉහළ කළමනාකරණය විසින් විධිමත් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතු අතරහිඟ , පැරණි ශේෂ අයකර හිටි ගැනීමට සහ ඒවා නිරවුල් කිරීමටත් දැඩි පාලන උපක්‍රම අනුගමනය කිරීමටත් ඉදිරියේ දෙනු ලබන මුදල් සහ සේවා මත ණයගැති ශේෂ බොල් ණය නොවී අයකර ගැනීමටත් ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ආ) 2021 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.71,334,541 ක් වූ චිත්‍රපට නිෂ්පාදන ණයගැතියන් 105ක් මඟින් ණයගැති ශේෂ සනාථන ලිපි කැඳවීම් සිදු කළ අතර, විවිධ හේතූන් මත එම ලිපි අතුරින් ලිපි 22 ක් භාර නොගැනීම නිසා නැවත සංස්ථාව වෙතම ආපසු ලැබී තිබුණි. ඒ අනුව ශේෂ තහවුරු නොවූ නිෂ්පාදන ණයගැතියන් 22 ක් මත සංස්ථාවට අයකරගත නොහැකි නිෂ්පාදන ණය මුදල රු.20,401,950ක් විය. | නිරීක්ෂණය නිවැරදිය. | ණය වාරික හා පොළී අයකර ගැනීම පිළිබඳ වූ ක්‍රියාවලිය ඉහළ කළමනාකරණය විසින් විධිමත් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතු අතර, හිඟ හිටි පැරණි ශේෂ අයකර ගැනීමට සහ ඒවා නිරවුල් කිරීමටත් දැඩි පාලන උපක්‍රම අනුගමනය කිරීමටත් ඉදිරියේ දෙනු ලබන මුදල් සහ සේවා මත ණයගැති ශේෂ බොල් ණය නොවී අයකර ගැනීමටත් ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදනය සහ සිනමාශාලා නවීකරණය සඳහා ලබාදී ඇති ණය මුදල් වලින් එකතුව රු.81,499,905 ක් සහ සිනමාශාලා වලින් සංස්ථාවට ලැබිය යුතු හිඟ මුදල් ලෙස එකතුව රු.375,003,940 ක් ඇතුළුව එකතුව රු.456,503,845 ක මුදලක් සංස්ථාව වෙත ලැබිය යුතුව තිබුණි. එම | චිත්‍රපට නිෂ්පාදනය සහ සිනමාශාලා නවීකරණය සඳහා 2021 වර්ෂය තුළ ගිවිසුම්ගතව ණය නිකුත් කර නොමැත. හිඟ මුදල් අයකර ගැනීමට | ණය වාරික හා පොළී අයකර ගැනීම පිළිබඳ වූ ක්‍රියාවලිය ඉහළ කළමනාකරණය විසින් විධිමත්ව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | මුළු ලැබිය යුතු මුදලින් එකතුව රු.333,443,132 ක් අධිභාර සහ අඩමාණ ණය ලෙස වෙන් කිරීම නිසා 2021 දෙසැම්බර් 31 දිනට අයකරගත හැකි ශුද්ධ ණය ශේෂය රු.123,060,713 ක් එනම් මුළු ණයගැතියන්ගෙන් සියයට 27 ක් විය. එම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ සෑම පියවරක්ම ගැනීමට කටයුතු කරමින් පවතී. | අතර, හිඟ හිටි පැරණි ණය ශේෂ අයකර ගැනීමට සහ ඒවා නිරවුල් කිරීමටත් දැඩි පාලන උපක්‍රම අනුගමනය කිරීමටත් ඉදිරියේ දෙනු ලබන මුදල් මත ණයගැති ශේෂ බොල් ණය නොවී අයකර ගැනීමටත් ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ආ) | විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.53,565,690 ක් වූ උපචිත වියදම් වලින් වටිනාකම රු.2,262,126 ක උපචිත වියදම් වසර 05 කට පෙර සිදු වූ ගණුදෙනු වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා විය. මේ අනුව උපචිත වියදම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | උපචිත වියදම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සංස්ථාව වෙත ලැබිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා 2021 වර්ෂයේදී හිඟ මුදල් අයකර ගැනීමේ කමිටුවක් පත් කර තිබුණි. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින්ද 2021 දෙසැම්බර් 31 දිනට ආසන්න වසර 10 ක හිඟ ණය සහ හිඟ මුදල් විධිමත් ක්‍රමවේදයකට අනුව අයකර ගැනීමට උපදෙස් ලබාදී තිබුණි. නමුත්, හිඟ මුදල් අයකර ගැනීමේ කමිටු නිර්දේශ 2023 මාර්තු 31 විගණිත දින දක්වා නිකුත් කර නොතිබූ අතර, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු උපදෙස් ප්‍රකාරව හිඟ ණය අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ පත් කරන ලද හිඟ මුදල් අයකර ගැනීමේ කමිටු නිර්දේශ මෙතෙක් ඉදිරිපත් කර නැත. එම නිර්දේශ ඉදිරිපත් කළ වහාම ඒ අනුව ක්‍රියා කරනු ලැබේ. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු උපදෙස් සහ ණය අයකර ගැනීමේ කමිටු උපදෙස් ප්‍රකාරව ක්‍රියාකර හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කුරුඳුවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මු.නි.කො.9848 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.1235 ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමකින් තොරව ප්‍රධාන කාර්යාලය ඇතුළු ගොඩනැගිලි කිහිපයක් ඉදිකර එහි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි. | සංස්ථාව පිහිටි මෙම ඉඩම් කොටස පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | සංස්ථාවට අයත් අංක 224 දරන පරිශ්‍රයේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහල අංක 4660 දරන බදු ගිවිසුම ප්‍රකාරව 2019 ජනවාරි 14 දින දක්වා මසකට රු.315,000ක බදු කුළී පදනම මත සංස්ථාව විසින් සැලසිනේ රූපවාහිනී ආයතනය වෙත ලබාදී තිබුණි. බදු ගිවිසුම යාවත්කාලීන කිරීමකින් තොරව සහ එකතුව රු.12,111,000 ක් වූ හිඟ බදු මුදල් ගෙවීමකින් තොරව ගොඩනැගිල්ල භාවිතා කර 2022 මාර්තු 28 දින ගොඩනැගිල්ල නැවත සංස්ථාව වෙත භාරදී තිබුණි. 2023 මැයි මස දක්වා මෙම හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2022 මාර්තු 28 දිනෙන් පසුව මෙම ගොඩනැගිල්ල ඵලදායී කාර්යයක යොදවා නොතිබුණි. | සංස්ථාව වෙත අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගැනීමට ලිපිගොනුව යොමු කර ඇත . | සංස්ථාවේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව හිඟ මුදල් බදු ගැණුම්කරුගෙන් අයකර ගැනීමටත් ගිවිසුම් අත්සන් කළ පාර්ශවයක් ලෙස සංස්ථාව ඉහළ කළමනාකරණය අදාළ ගිවිසුම් ක්‍රියාවේ යෙදවීමටත් කටයුතු කළ යුතුය. |
| (ඊ) | සංස්ථාවට අයත් අංක 224 දරන පරිශ්‍රයේ පිහිටි තනි මහල් ගොඩනැගිල්ල 2007 වර්ෂයේ සිට ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය වෙත බදු කුළී පදනමට ලබාදී තිබුණි. දෙපාර්ශවය අතර අවසන් වරට 2017 ජනවාරි 23 දින අත්සන් කළ අංක 4711 දරන බදු ගිවිසුම 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. රැඟුම් පාලක මණ්ඩලය විසින් එම බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි කඩකරමින් එම ගොඩනැගිල්ල කඩා ඉවත් කර වර්ග අඩි 2576 ක නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. බදු ගිවිසුම අවලංගු වී වසර 03 කට වැඩි කාලයක් ගතවී ඇතත්, පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දී ඇති මෙම නිරීක්ෂණය පිළිබඳ අවධානය යොමු කර නව ගොඩනැගිල්ල සඳහා තක්සේරු වාර්තාවක් ලබාගෙන බදු කුළිය තක්සේරු කර, විධිමත් බදු | ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය සහ සංස්ථාව අතර නව බදු ගිවිසුමකට එළඹීමට බදු ගිවිසුම් කාලසීමාව සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට නව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | මෙම කරුණ පිළිබඳ වගකිව යුතු පාර්ශවයන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත්, විධිමත් ලිඛිත ගිවිසුමකට කඩිනමින් එළඹීමටත්, සංස්ථාව සතු වත්කම් ආරක්ෂා කිරීමටත් කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. | | |
| (උ) | ආචාර්ය “ලෙස්ටර් ජේම්ස් පීරිස්” මහතා නමින් සංස්ථා පරිශ්‍රය තුළ කෞතුකාගාරයක් සහ පුස්තකාලයක් ඉදිකිරීම සඳහා ඉදිකිරීම සහ උපදේශනාත්මක කටයුතු ඇස්තමේන්තුගත එකතු වටිනාකම රු.99,965,061 කට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා දීමට ද්විපාර්ශවික ගිවිසුමකට එළඹ 2019 අප්‍රේල් 05 දින එහි ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියේ සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් රහිතව ආරම්භ කළ මෙම ඉදිකිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.3,134,107 ක් ගෙවීම් කර තිබුණි. පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දුන් මෙම ඉදිකිරීමේ කටයුතු වසර 03 කට වැඩි කාලයක සිට අතහැර දමා තිබූ අතර, ඉදිකිරීම් ආරම්භ කළ මෙම ගොඩනැගිල්ලේ ඇති යකඩ කූරු දැඩි ලෙස භායනයට ලක්වීම නිසා ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවතුණි. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් ආරම්භ කර ඇති ඉඩම සඳහා නව ඔප්පුවක් සකස් කර ගැනීමට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇත. ප්‍රසම්පාදන තීරණ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතක් 2020 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළද, අමාත්‍යාංශය මඟින් ඉදිරි කටයුතු සිදු නොවීම නිසා ව්‍යාපෘතිය අතරමඟ නතර වී ඇත. | 2021 ජූලි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඌ) | 2021 දෙසැම්බර් 31 දිනට විවිධ අධිකරණ වල තවදුරටත් විභාග වෙමින් සංස්ථාව විත්තිකරු වූ නඩු කටයුතු 15 ක්ද, කම්කරු පැමිණිලි 05 ක්ද, චිත්‍රපට සහ ටෙලි නාට්‍ය අධ්‍යක්ෂකවරු සහ නිෂ්පාදකවරු විසින් මානව හිමිකම් කොමිසම් සභා කාර්යාලයේ ගොණු කර පැවති මානව හිමිකම් පැමිණිලි 09 ක්ද, අවසන් තීරණයන් ලබාදීමට නොහැකිව විභාග කරමින් පැවතුණි. මෙම පරීක්ෂණ වර්ෂ ගණනාවක සිට විභාග වෙමින් පැවතීම නිසා සංස්ථාවේ ඉහළ තනතුරු කිහිපයක ස්ථිර තනතුරු දරන නිලධාරීන් නොමැති වීමත්, අධිකරණ කාර්යයන් සඳහා සේවයේ නිරත නිලධාරීන්ගේ රාජකාරී කාලය ගත කිරීමට සිදු වීමත් සංස්ථාවේ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපෑම් ඇති කර තිබුණි. | අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වන තෙක් පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා ආසන්න නිලධාරියාට වැඩ බැලීමට පත්වීම් ලබාදී ඇත. කාර්ය මණ්ඩල ප්‍රතිසංවිධානයෙන් පසු සංවිධාන ව්‍යුහය හා බඳවා ගැනීම් පටිපාටියේ සිදුවන වෙනස්කම් අනුව පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කෙරේ. | 2021 ජූලි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා උපදෙස් ප්‍රකාරව මෙම පරීක්ෂණය කඩිනමින් අවසන් කර සේවක ගැටළු අවම කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | කැලණිය දළුගම සරසවි චිත්‍රාගාරයේ පැරණි චිත්‍රපට වල දල සේයාපටල සංරක්ෂණය කිරීම සඳහා චිත්‍රපට සංරක්ෂණාගාරයක් පවත්වාගෙන ගොස් තිබුණි. එම චිත්‍රපට සංරක්ෂණාගාරයේ සිදු කළ භෞතික විගණන පරීක්ෂාවේදී එසේ සංරක්ෂණය සඳහා තබා ඇති දල සේයාපටල පිළිබඳ ලිඛිත සනාථන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකළ අතර, සංරක්ෂිතව ගබඩා කර තබා තිබූ ඇතැම් චිත්‍රපට වල දල සේයාපට සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් අස්ථානගතවී තිබුණි. සංරක්ෂිත දල සේයාපටල පිළිබඳ ලැයිස්තුවක් යාවත්කාලීනව පවත්වා නොගැනීම නිසා අස්ථානගත වූ දල සේයාපටල පිළිබඳ ප්‍රමාණාත්මක විස්තර නිරීක්ෂණය කිරීමටද නොහැකි විය. එම දල සේයාපටල ආරක්ෂා කිරීමටද කළමනාකරණය පියවරගෙන නොතිබුණි. | ඇතැම් දල සේයාපට සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් විනාශ වී ඇත. ඉදිරි තොග සමීක්ෂණයන්හිදී ඒවා වාර්තා කර පියවර ගැනීමට සටහන් කර ගතිමි. | දල සේයාපටල පිළිබඳ ලැයිස්තු පවත්වාගෙන යා යුතු අතර, දල සේයාපටල ආරක්ෂා කිරීමටත් කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------------------------------ | -------------------- | ---------------- |
| (අ) | 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 4 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවෙහි නිපදවනු ලබන චිත්‍රපට සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ඉල්ලුම සහ චිත්‍රපට වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්ථාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානය වන විට චිත්‍රපට නිෂ්පාදන කණ්ඩායම් විසින්ම ප්‍රවර්ධන කටයුතු සිදු කරනු ලබයි. | පනතේ සඳහන් වගන්ති අනුව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 4 (ඌ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපොල පර්යේෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | මෙම කාර්යය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් කාර්යය ආරම්භ කිරීමට නොහැකි විය. | පනතේ සඳහන් වගන්ති අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | උසස් ශ්‍රී ලාංකේය සිනමා සංස්කෘතියක් බිහි කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ශාස්ත්‍රීය, සංකල්පීය සහ තාක්ෂණික පදනමක් සකස් කිරීමේ අරමුණු පෙරදැරි කරගෙන සිනමාකරණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කර තිබුණි. 2020 වර්ෂයේදී කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ සිසුන් බඳවාගෙන නොතිබූ අතර, 2021 වර්ෂයේදී සිසුන් 43 බඳවාගෙන 2021 මාර්තු 27 දින පාඨමාලාව ආරම්භ කර | සිනමා ඩිප්ලෝමා පාඨමාලාව වඩාත් උසස් තත්ත්වයට පත් කිරීම සඳහා විෂය නිර්දේශය සකස් කර ඇති අතර, මූල්‍ය ගැටළු නිසා පහසුකම් සම්පූර්ණ කර | සිනමාකරණය පිළිබඳ වූ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සිනමා පාසලක් දක්වා වර්ධනය කර සංස්ථාවේ ආදායම් ඉහළ නංවා ගැනීමට ක්‍රියා කළ |

| | | | |
|---|---|---|---|
| | 2022 සැප්තැම්බර් 27 දින මෙම පාඨමාලාව අවසන් කර තිබුණි. මෙම ඩිප්ලෝමාව සිනමා පාසලක් දක්වා වර්ධනය කිරීමට ව්‍යාපෘති සකස් කර විෂය නිර්දේශයද සකස් කර පැවතියද, 2023 මාර්තු මස දක්වා එම කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | ගැනීමට නොහැකි විය. | යුතුය. |
| (ඇ) | "චිත්‍රපට බෙදාහැරීම සහ ප්‍රදර්ශනයට අදාළ ක්‍රමවේදය" සකස් කර එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 ජූනි 22 දිනැති අංක අමප/21/1024/305/022 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී පැවති අතර, එම අනුමැතිය ප්‍රකාරව චිත්‍රපට බෙදාහැරීමේ ක්‍රියාවලිය සංස්ථාවට පවරා ගැනීම සඳහා මෙම ක්‍රමවේදය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කළ යුතුව තිබූ නමුත්, 2022 ඔක්තෝබර් මස දක්වා යථෝක්ත කරුණ ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. | චිත්‍රපට බෙදාහැරීම් සහ ප්‍රදර්ශන ක්‍රමවේද ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමට 2021 අගෝස්තු 17 දින විෂයභාර අමාත්‍යවරයා වෙත යොමු කර ඇත. | සංස්ථාවේ අභිවෘද්ධිය සඳහා 2021 ජූනි 22 දින අමාත්‍ය මණ්ඩලය ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාවේ යෙදීමටත්, ඒ සඳහා වන ගැසට් පත්‍රය නිකුත් කිරීමටත් ඉහළ කළමනාකරණය ක්‍රියා කිරීමට සුදුසු වේ. |

**3.4 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කැලණිය දළුගම සරසවි චිත්‍රාගාරය පිහිටි භූමිය තුළ වූ පොකුණු පවිත්‍ර කර චිත්‍රාගාරයකට ගැළපෙන පරිදි පවත්වා ගැනීමටත්, එම භූමිය හරහා ගලා යන ඇළ පිරිසිදු කර පවත්වා ගැනීමටත් ක්‍රියා කර නොතිබුණි. තවද, චිත්‍රාගාර භූමිය තුළ කඩා ඉවත් කළ යුතු දිරාපත් වූ තනි මහල් ගොඩනැගිල්ලක්ද පැවතුණි. චිත්‍රාගාරයට පිවිසුම් දොරටුවෙහි නාම පුවරුවක් සවි කිරීමටත්, චිත්‍රාගාර භූමිය චිත්‍රාගාරයකට ගැළපෙන පරිදි දර්ශනීය ලෙස පවත්වා ගැනීමටත් ඉහළ කළමනාකරණය අවධානය යොමු කර නොතිබූ අතර, නාගරික පරිසරයක පිහිටි මෙම චිත්‍රාගාර පරිශ්‍රය සහ එයට අයත් භූමිය සංස්ථාවට ආර්ථික ප්‍රතිලාභ ලබාගත හැකි කාර්යයක යෙදවීමට ක්‍රියා නොකිරීම නිසා නිශ්කාර්යය වත්කම් ලෙස පැවතුණි. | පොකුණ පිළිසකර කර ගැනීම, ඇළ මාර්ගය පිරිසිදු කර ගැනීම සහ චිත්‍රාගාර භූමිය තුළ ඇති කඩා ඉවත් කළ යුතු ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට කටයුතු කරමින් පවතී. චිත්‍රාගාර භූමි අලංකරණය සම්බන්ධ කාර්යය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් කරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | චිත්‍රාගාර භූමිය සහ ගොඩනැගිලි ඵලදායී කාර්යයන් වල යොදවා ආදායම් ඉහළ නංවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.870,659 ක් වූ දළ සේයාපට | මෙම තොගයෙන් කොටසක් ප්‍රදර්ශන | ප්‍රයෝජනයට ගත නොහැකි මෙම |

| | | |
|---|---|---|
| සහ රසායන ද්‍රව්‍ය තොගයක් 2014 වර්ෂයේ සිට කල් ඉකුත් වීම සහ වර්තමානයේ භාවිතා නොකිරීම නිසා ප්‍රධාන ගබඩාව තුළ පැවති අතර, පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තා මගින්ද පෙන්වා දුන් මෙම නිශ්කාර්ය වත්කම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ ලෙස තබා ඇති අතර, ඉතිරි ප්‍රමාණය අපහරණය කිරීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ. | සේයාපටල හා රසායන ද්‍රව්‍ය තොග පිළිබඳ නිවැරදි තොරතුරු භාණ්ඩ සමීක්ෂණ වලදී හඳුනාගෙන ඒවා එම සමීක්ෂණ මණ්ඩල කමිටු තීරණ අනුව හා පවත්නා නීති රීති අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සංස්ථාවට අයත් "තරංගනී" සිනමා ශාලාවේ කටයුතු සඳහා රු.11,460,155 ක් ගෙවා, 4K DCP ප්‍රොජෙක්ටරයක් මිලදීගෙන තිබුණි. නමුත්, මෙම යන්ත්‍රය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ගැනීම සඳහා අවශ්‍ය අමතර කොටස් 2022 වර්ෂය දක්වාම මිලදී ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි. මෙම ප්‍රොජෙක්ටරය ක්‍රියාකාරී තත්ත්වයට පත් කර ගැනීමට නොහැකි වීම නිසා එය මිලදී ගැනීමට වැය කළ මුදල් සහ "තරංගනී" සිනමාශාලාව නිශ්කාර්ය වත්කම් බවට පත්වී තිබුණි. | මෙම යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා නියෝජිත ආයතනය වෙත යොමු කර පරීක්ෂණ වාර්තාවක් හා ඇස්තමේන්තුවක් ලබාගෙන ඒ අනුව ක්‍රියා කරනු ලැබේ. | මෙම ප්‍රොජෙක්ටරය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර "තරංගනී" සිනමාශාලාව ආදායම් ඉපයීම සඳහා භාවිතා කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) චිත්‍රපට ආනයනය, බෙදාහැරීම හා ලියාපදිංචිය විධිමත් කිරීම සඳහා පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමේ (E-Ticketing) ව්‍යාපෘතිය සඳහා 2021 අනුමත සංශෝධිත අයවැය වාර්තාව අනුව වෙන් කළ ඇස්තමේන්තුගත මුදල රු.11,000,000 ක් විය. 2021 දෙසැම්බර් 31 දිනට මෙහි භෞතික කාර්යසාධනය සියයට 40 ක් වූ අතර, මූල්‍ය ප්‍රගතිය සියයට 0 ක් විය. අදාළ ව්‍යාපෘතියේ ආරම්භක ප්‍රසම්පාදන කටයුතු සඳහා මිල කැඳවුම් මත ආයතනයක් තෝරා ගැනීම පමණක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණි. | මෙම ව්‍යාපෘතියේ සැපයුම්කරු 2022.04.19 තෝරාගෙන ඇත. ඒ අනුව 2022 වර්ෂයේදී ගෙවීම් කිරීම ආරම්භ කර ඇත. | ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් සිදුකර පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2021 වර්ෂයේදී කැළණිය දළුගම සරසවි චිත්‍රාගාරය සඳහා එකතුව රු.857,050 ක් ගෙවීම් කර 5.1 ප්‍රමාණයේ ශබ්ද ප්‍රතිවාදන පද්ධතියක් මිලදීගෙන තිබුණි. එම ප්‍රසම්පාදන කාර්යය ඉටු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 (ඇ), 4.3.2 සහ 5.3.2 වගන්ති ප්‍රකාරව වූ පූර්ව ප්‍රසම්පාදන කටයුතු, මුළු පිරිවැය ඇස්තමේන්තු අනුමත කිරීම් සහ ලංසුකරුවන් වෙත ඇරයුම් සිදු කිරීම් වැනි ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ඉටු කර නොතිබුණි. | මෙය ඉතා හදිසි ප්‍රසම්පාදන කාර්යයක් බවට පත්ව තිබූ අතර, මෙම පද්ධතිය ස්ථාපනය කිරීමෙන් පසු මේ වන විට රු.මිලියන 2.3 ක පමණ ආදායමක් උපයා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 186 ක් වූ අතර, තත්‍ය සේවක සංඛ්‍යාව 119 ක් විය. 2021 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු වලින් තනතුරු 67 ක් පුරප්පාඩු වී පැවතුණි. එම පුරප්පාඩු වලින් තනතුරු 10 ක් දැනට සංස්ථාවේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු වැඩබැලීම, රාජකාරි ඉටු කිරීම, රාජකාරී ආවරණය කිරීම වැනි වෙනත් පදනමකට සම්පූර්ණ කර තිබුණි. සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් පැවති අතර, එම තනතුරු 03 න් තනතුරු 02ක්ම ස්ථිර නොවන වෙනත් පදනමකට නිලධාරීන් පත්කර සේවයේ යොදවා තිබුණි. සංස්ථාවේ මෙම සේවක පුරප්පාඩු දීර්ඝ කාලයක සිට ස්ථිර පදනම මත සේවයට බඳවාගෙන සම්පූර්ණ නොකිරීම එහි ක්‍රියාකාරීත්වය සහ කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑම් ඇති කර තිබුණි. | විවිධ හේතූන් මත බඳවා ගැනීමට නොහැකි වූ තනතුරු සඳහා අදාළ ආසන්න නිලධාරියාට වැඩබැලීම්/ රාජකාරි ඉටු කිරීම් පත්වීම් ලබාදී ඇත. කාර්ය මණ්ඩල ප්‍රතිසංවිධානයෙන් පසු පුරප්පාඩු සම්පූර්ණ කෙරේ. | රජයේ වර්තමාන උපදෙස් ප්‍රකාරව කටයුතු කරමින් සේවක කළමනාකරණය සිදුකර ආයතනයේ කාර්යභාරය ඉටු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ III වන කොටස 16 (2) ඡේදය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මගින් | 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි මස අවසන් වන විට සකස් කර තිබුණ ද බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ තිබූ චිත්‍රපට සංස්ථාව ජනමාධ්‍ය | ජාතික විගණන පනතේ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති |

| | | |
|---|---|---|
| ඇතුළත් කළ මුදල් රෙගුලාසි 877 (2)(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සංස්ථාවේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසරක ප්‍රමාදයකින් පසුව 2023 පෙබරවාරි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | අමාත්‍යාංශය යටතට පත්කල බැවින් එම මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලබාගැනීම නව අධ්‍යක්ෂ මණ්ඩලයක් හා විගණන කමිටුවක් පත්කරගන්නා තෙක් ප්‍රමාද විය .ඒ අනුව නව අධ්‍යක්ෂකවරු පත්කර 2022.11.11 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ තිරණය අනුව ඉදිරිපත් කරන ලද 2021 මූල්‍ය ප්‍රකාශන, විගණන කමිටුවට ඉදිරිපත් කර එම නිර්දේශය මත නැවත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන 2023 පෙබරවාරි මස ගිණුම් විගණනය සඳහා ලබාදෙන ලදි. | වෙත ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |

## 4.2 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1971 අංක 38 දරන මුදල් පනතේ වගන්ති අංක 14 සහ 2003 ජූනි 02 දිනැති පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්ති ප්‍රකාරව අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත භාෂා 03 කින් යුත් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව තුළ සභාගත කළ යුතු වුවද, සංස්ථාවේ වාර්ෂික වාර්තා 2015 න් පසු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2015 – 2017 වාර්ෂික වාර්තා මුද්‍රණය කර ඇති අතර, පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට රේඛීය අමාත්‍යාංශයට යොමු කර ඇත. 2018, 2019 සහ 2020 වාර්ෂික වාර්තා සකස් කරමින් පවතී. | 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වන වාර්ෂික වාර්තා අප්‍රමාදව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්ති ප්‍රකාරව ජාතික චිත්‍රපට සංස්ථාවේ 2021 වර්ෂය ආවරණය කරමින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශ උපදෙස් ලබාගෙන තුන් අවුරුදු සැලැස්මක් සකස් කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | 2003 ජූනි 02 දින හා අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලසුම් සකස් කර අනුමැතිය ලබාගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුය. |

## 4.4 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ VII වන කොටස 40 (1) ඡේදය ප්‍රකාරව අදාළ ආයතනය සඳහා තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවද, 2021 දෙසැම්බර් වන විට අභ්‍යන්තර විගණක සහ අභ්‍යන්තර විගණන අංශයේ සේවය කළ නිලධාරිනිය සංස්ථා සේවයෙන් ඉවත් වීමෙන් පසුව සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය අක්‍රීයව පැවතිණි. | අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට කටයුතු කරමින් පැවතියද, රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් හා රාජ්‍ය ප්‍රතිපත්ති මත බඳවා ගැනීම් අත්හිටුවා ඇත. | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර හෝ භාණ්ඩාගාර උපදෙස් පරිදි ක්‍රියාකර අභ්‍යන්තර විගණන අංශය සඳහා කාර්යය මණ්ඩලය යොදවා අභ්‍යන්තර විගණනය සිදු කළ යුතුය. |